# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 11
NUMBER 05

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

AUGUST 10, 2008 අගෝස්තු මාසය (බුද්ධ වර්ෂ 2552 නිකිණි මාසය)


# ප්‍රවේශමෙන්!

**සංජය විමලරත්න විසිනි**

අප රටේ කෙරෙන කොටි ත්‍රස්ත විරෝධී සටන තීරණාත්මක ලෙස අවසන් අදියරට ළං වෙමින් පවතින බව යුද පෙරමුණෙන් එන පුවත්වලින් පෙනී යයි. අද අගෝස්තු **6** වෙනිදා මේ ලියන මොහොතේ අපේ වීරෝදාර හමුදා සේනාංක බල කණ්ඩායම් කීපයක්ම පැති කීපයකින්ම කොටි ප්‍රහාර කල්ලිවලට ප්‍රතිප්‍රහාර එල්ල කරමින්, උන් පසුබස්සමින් ඉදිරියට යමින් සිටිති. වවුනියාව පැත්තෙන් බොහෝ දුර උතුරට ද, මන්නාරම පැත්තෙන් උතුරට මෙන් ම නැගෙණහිරට ද ස්ථාවර ලෙස පෙරට යමින් කොටින්ව මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක වලට කොටුකර ඇත.

පසුගිය අප්‍රේල් මස මැද දී මඩු පල්ලිය ප්‍රදේශයෙන් කොටියන් පළවාහැරීමෙන් පසු අප හමුදාවෝ දිගින් දිගටම ඉදිරියට ගියහ. ක්‍රමයෙන් මන්නාරම දිස්ත්‍රික්කයෙන් උතුරු දෙසට සටන් ගෙන ගිය අතර මේ අගෝස්තු 2 වෙනි දා මන්නාරම් උතුරු කෙළවරේ මහ නගරය වූ වෙල්ලන්කුලම් අල්ලාගැනීමෙන් මුළු මන්නාරම් දිස්ත්‍රික්කයම රජය යටතට පත් විය. එතැන් සිට උතුරට ඇත්තේ කිලිනොච්චි දිස්ත්‍රික්කයයි. **58** සහ **59** වන බලකායයන් උපක්‍රමශීලී ලෙස කිලිනොච්චි ප්‍රදේශයේ බැඳගෙන සිටි කොටි කඳවුරු ගණනාවක්ම වටේ මහා වනාන්තරයේ මැදින් යමින් කොටින් බලාපොරොත්තු නොවූ පරිදි උන්ට හදිසියේ ප්‍රහාර එල්ලකර ඒ කඳවුරු විනාශකිරීමටත්, කොටි පළවාහැරීමටත් සමත්ව ඇත. ඒ සමහර තැන්වල පිසිමින් සිටි ආහාර මුට්ටි පවා හැර දමා පැනයන්නටද, තව තැනක රජයේ හමුදාවල ඉදිරිගමන වැලැක්වීම පිණිස කඩාදැමීමට උත්සාහ කළ පාලමක් එය බාගෙට කඩමින් තිබියදී පලායන්නටද උන්ට සිදුව ඇත. එම පාලම නැවත ප්‍රකෘති තත්වයට ගෙන ඒමට හමුදාවලට හැකිවී තිබේ. තවත්තැනක කොටි උන්ගේ ගුවන් පණිවුඩ උපකරණ ද රැගෙන පලාගොස් ඇති අයුරු කුළුනුවල කැඩී එල්ලෙන වයර් කම්බි ආදියෙන් පෙනෙන්ට තිබිණ. මේ සියල්ල රූපවාහිණී මාධ්‍යමගින් රටට පෙන්වන ලදී.

කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක ජනගහනයෙන් අඩු වුව ද භූමි ප්‍රමාණයෙන් විශාල ය. එසේම ඝන කලෑවලින් පිරී පවතී. වව්නියා දිස්ත්‍රික්ක මායිමේ සිට උතුරට හා නැගෙණහිරට විහිදෙන මුලතිව් දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර් **1660** ක් පමණ වෙයි. නැගෙණහිර වෙරළ දක්වා විහිදෙන මෙහි එම වෙරළබඩෙහි මුලතිව් නගරය පිහිටා ඇත. පූනරින් වැනි කොටින්ගේ මුහුදු තොටුපළවල් මෙහි පිහිටා ඇත. වව්නියාවේ සිට උතුරට යන **A9** මහා මාර්ගය මුලතිව් හරහා ඒ මැදින් දිවෙයි. එම දිස්ත්‍රික්කය ඉවරවෙන මායිමේ සිට උතුරේ පරන්තන් හා අලිමංකඩ දක්වා වූ ප්‍රදේශය කිලිනොච්චි දිස්ත්‍රික්කයයි. **A 9** මාර්ගයේ පරන්තන් පැත්තට ළංව එම දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය වන කිලිනොච්චිය පිහිටා ඇත. කොටින්ගේ පාලන මධ්‍යස්ථානය මෙය වෙයි. ප්‍රභාකරන්ලා සැඟවී සිටින බලකොටු මෙයින් නැගෙණහිරට මහ ඝනවනාන්තරයේ පිහිටා ඇත. මන්නාරමේ සිට යාපනය අර්ධද්වීපයට ළංවූ පූනරින් දක්වා වූ අනෙක් ප්‍රධාන මාර්ගය වන **A32** ඝන කැලෑව මැදින් ඊසාන පැත්තට දිවෙයි. **A 32** සහ **A 9** අතර තිබෙන විශාල ප්‍රදේශය ඝන කැලෑවෙන් වැසී ඇත. කොටින්ට එදිරිව තද සටන් සිදුවනු ඇත්තේ මෙහි ය. මා මේ දැක්වූයේ ප්‍රදේශ පසුබිමයි.

අප හමුදා කිලිනොච්චි දිස්ත්‍රික්කයට ඇතුල් වුවද කිලිනොච්චි නගරයට එනම් කොටි මධ්‍යස්ථානයට තව බොහෝ දුරක් ඇත. මේ දෙක පටලවා ගත යුතු නොවේ. සමහර මාධ්‍යවලින් පවා මේ වැරදි හැඟීම ඇතිකර තිබේ. පසුගිය සටන් වලදී අප හමුදා සටන් කළ ආකාරයෙන් මෙවැනි ඝන වනාන්තර තුළ සටන් වලට ඔවුන් දැන් ඉතා හුරු පුරුදු බව ද, බොහෝ තැන්වලදී කොටින් මුලාකොට වටලා විනාශකිරීමට ද යුද්ධ උපාය මාර්ග උපයෝගී කරගැන්මෙහි එම සේනාධිපතීන් දක්ෂවී ඇත. මේ පිළිබඳව ඒ සටන් ගැන කළ විමසුම් වලදී යුද්ධ ගැන දන්නා විදේශ විචාරකයින් ඒ ගැන අගය කර තිබේ. මෙය දිගටම ගෙනයාමට ඔවුන්ට ශක්තිය ඇත. කොටින් පැරදවිය හැකිය යන්න අප සන්නද්ධ හමුදා තහවුරුකර තිබේ.



Kandyan Dancer - *Photo* - Domnic Sansoni - *Sri Lanka*

තනම් තනම් දෙන පෙදෙන් පෙදෙන් පා
තබත් හඬයි නුපුරත් ඉතින්
නළල් පටින් විදි රිදි කැළුම් වන්
රැයේ බලන් හිඳි සුපුන් වතින්
ලලිත් ලෙසින් නව නවා යුගත් පෑ
රැඟුම් උසස් සොඳ පහන් සිතින්
ඔබෙන් තරම් ලක් මවුන් ලැබූ කිත්
පසස් ලැබෙත් කොයි කෙනෙක් වෙතින්?

♦ *දයා ආනන්ද රණසිංහ*

එහෙත් ඉතාම අමාරු කොටස තව ඉදිරියට ය. ජය අත ළඟයයි උද්දාමවීමට කාලය තව එළඹ නැත. අප ජනතාවට එවැනි වැරදි දේ හැඟීම් දීම ද නුසුදුසු ය.

කොටියා දරුණු සතුරෙකු බව අප අමතක කළ යුතු නොවේ. මෙය කොටින්ගේ ද ප්‍රභාකරන්ගේ ද අන්තිම සටනයි. අප රටේ සුළු ප්‍රදේශයකට කොන් කරනු ලැබූව ද උන් එය ලෙහෙසියෙන් අත්හරිනු නොමැත. **වෙඩි වැදුණු කොටියා භයානකම කොටියා** යයි කියමනක් ඇත. පසුගිය දිනවල උන් පසු බැස්සේ බැරිකම නිසායයි කිසිසේත් අවතක්සේරු නොකළ යුතුය. යම් දිනක මෙවැනි තීරණාත්මක සටනක් බලාපොරොත්තුවෙන් උන් ආයුධ වලින් සන්නද්ධව ඇතුවා නිසැක ය. ඉදිරිය බරපතල වනු ඇතියි නිරීක්ෂකයින් කියන්නේ ඒ නිසයි. විශාල බංකර් වලින් සමන්විත කොටි බල ප්‍රදේශය ඉදිරියේ ය. ඝන වනාන්තරය ද උන්ට උදව් වනු ඇත. එසේම එය අප හමුදාවන්ටද උදව් වෙනවා ඇත.

මේ හැර අවසන් සටනේ දී කොටින් වෙනත් උපක්‍රමද යොදා ගන්නවා ඇත. **යන යකා කොරහත් බිඳගෙන යනවා සේ** උන් රටටද සිංහළ ජනතාවටද උපරිම විනාශයක් පමුණුවන්නට සිතා සිටිනවා නිසැකය. රට තුළ සුපුරුදු මරාගෙන මැරෙන බෝම්බ කල්ලි ක්‍රියාත්මක කිරීමට බොහෝ සේ ඉඩ ඇත.

දැනට නිශ්ශබ්දව සිටියද කොටියන්ට උදව්දෙන දේශ ද්‍රෝහීන් ද අප රට ඇතුළේම සිටිති. පිටරට වලද සිටිති. එසේම දේශීය හා විදේශීය ප්‍රතිගාමී මාධ්‍යකරුවන්ද, විවිධ පෙරමුණුද, සාම කාක්කන්ද යුද්ධය තදේට ඇදෙන විට නැවත පටන්ගන්නවා ඇත. ප්‍රභාකරන්ට පැනයාමට පවා රට ඇතුළෙන්ම උදව්ද ලැබෙනු ඇත. සම්බන්දන් වැනි අප පාර්ලිමේන්තුවෙන් යැපෙමින් දේශ ද්‍රෝහි ප්‍රකාශයන් කරන කැනහිලුන් ගැනද විමසිල්ලෙන් සිටිය යුතු ය. මේ අදෘශ්‍යමාන සතුරන් ඉන්නේ තව ඉදිරියේ සටන යනතුරු ය.

දැන් සමහරු ජනතාව අද මුහුණ දී තිබෙන අධික ජීවන වියදම හා උද්ධමනය ගැන ද ප්‍රචාර පටන් ගන්නට බලති. මේ උද්ධමනය මේ එංගලන්තයේ ද අප කාටත් සෑම අංශයකින්ම දැනේ. මුන් මේවා ගෙන එන්නේ ජනතාවට ඇති ආදරේටද? නැත. මේ උග්‍ර අවස්ථාවේ ඒ සටන මොටකිරීමටය. පරදින සතුරාට උදව්දීමට ය. සමහර විට ඉහළ තැන්වලම පාලකයින් වට කොට සිටිනා මූඨ කේවට්ටයින් ද වැරදි අදහස් දීමට ඉඩ තිබේ.

මෙතෙක් අප ජනාධිපතිතුමා ඇතුළු රජයද, අප හමුදාපතීන් ඇතුළු රණවිරු හමුදාවන්ද, ඒ සමග රටේ දේශප්‍රේමී ජනතාවද දේශීය හා විදේශීය සතුරන් හා මිතුරන් වෙන්කොට හඳුනාගනිමින් රට මුදාගැන්මේ මෙම වටිනා කාර්‍යයට අත සිත මෙන්ම නායකත්වය දෙමින් සිටීම සතුටට කරුණකි. ඒ ස්ථාවරයේම නොසැලී දැඩිව පිහිටන අතර, අප ඉහත ශීර්ෂ පාඨයේ සඳහන් කර ඇති අයුරු ප්‍රවේශමෙන් ඉදිරියට ගමන්කිරීමට ශක්තිය හා ධෛර්‍යය නොඅඩුව ලැබේවායි පතමු.

එසේම මෙම අතිශය තීරක මොහොතේ දේශපාලන පක්ෂ බේදයෙන් තොරව සියලු දෙස්හි වෙසෙන සකල සිංහළ ජනතාවට තම ආදරණීය මාතෘභූමිය වෙනුවෙන් දියහැකි උපරිම සහයෝගයට මේ අවස්ථාව බව සිතන මෙන් ඉල්ලමි. වසර තිහක් දුක්ඛ අන්ධකාරයේ සිටි ලංකාමාතාවට සහනයේ අරුණැල්ලක් පතිතවන්නට යන මොහොත මේ බව සිහිකරනු මැනවි. ඒ අප උපන් දේශය ය. එවැනි දේශයක් කොහිවත් නැත. ජය ම වේවා!

ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/




ලොවපුරා මුදල් යැවීම සඳහා
එකම විශ්වාසවන්ත නාමය

MCG FAST CASH
SEND TODAY - COLLECT TODAY



විස්තර පිටු අංක 3